

# පිය සටහන් සහ සොදුරු සන්නිවේදකයා

**ස්වර්ණකාන්ති රාජපක්ෂ**

හිරු එලිය, නිල් ජලය, තුරු කුසුම් විරහිතව මිහිතලය මත කායිකවු මිනිස් ජිවිතයට පෑවෑත්මක් නොමෑතිය. සහාව ධර්මයේ නාද රටා මුසුව මෙන්ම එහි දිගුවක් වු සංගීතය නොමෑතිව මානසික සුවය සාක්ෂාත් කරගෑනීමට මිනීස් කැළ අපොහොසත්ය. සංගීතයට සමවෑදීමට සියලූ මනුෂ්‍යයා තුළ පවතින ආසත්ත බව උත්සුක බව නිසර්ග සිද්ධ වන්නේය.

අද අප රසවිදින සංගීතය අප වෙත පවරා දෙන්නට අපේ පෑරැන්නන් කොතරම් ඈප කෑපවීම් අත්හදා බෑලීම් කරන්නට ඈද්ද, එසේ නම්, ගීතය පොදුජන හදවතට මෙතරම් ළෙන්ගතු වන්නේ මන්දෑයි විමසීම වටින්නේය. සංගීතය වනාහි පද රචනය සංගීතය සහ ගායනය නමැති තුන්පත් රටාවේ නිර්මාණාත්මක වියමනයි. ජ්තමයෙන්ම පද රචනය සංගීතයෙන් රසවත් කලහැකී විය යුතුය, එය සංගීතමය අත්දැකී මක් ලෙසින් අනාවරනය කලහැකිය, සංගීත වේදියෙකුට හා ගායකුකට පහසුවෙන් එම හැගීමට ආවේශ වන්නට හැකි සංක්ෂිප්ත කාව්‍ය නීබන්ධන විශේෂයකි. කලාව බිහිවන්නේ කවිය වෙතින්ය  එය මලත් පුසුඹත් වගේය. නිසග ප්‍රතිභාව උසස්වූ ගීත කාව්‍ය මෙන්නම සංගීතය පරිශීලනයෙන් උකහා ගන්නා දැනුම් පරාසය සහ ගායන සුබ ගුණය ඇසුරින් සුභාවිත ගීතය ART SONG නිර්මාණය වෙයි එය අත්‍යන්තයෙන්ම සවන ගෝචර වන්නේය.

දිය දහර සේ ගලයන නාද ආකෘතින් සහිත සංගීත සංයෝජන සොයාගෙන සිය හඩ ඇසුරින් ප්‍රබල භාව ප්‍රකාශනයක යෙදීමට ගුණදාස කපුගේ ශිල්පියා සමත් විය. මානව ප්‍රේමය විදාරණය කළ සොදුරු සන්නිවේදකයා ලෙසින් ඔහු ජන හදවත් තුළ සනිටුහන් වුයේ මේ සුවිශේෂී ගුණය නිසාය සෞන්දර්ය අභිභවගිය ජීවන යථාර්තය ස්ර්ශකොට එම කටුක බව යලිත් සෞන්දර්යය බවට පෙරලා ඔහු රසික ජනතාවට පිරිනැමුවේය. විරෝධාකල්ප ගී ගායනයට ලෙන්ගතුවූ ඔහුට එවන් අපුරු පාදමලා නිර්මාණය කරදෙන්නට දැනුමක් සහිත නිර්මාණකරුවන් පහලවී සිටීමද වාසනාවක්ය.

**ලෙලි තලන නුබේ දෑතට**
**රන්මුදුව ගොරහැඩිද දෝනී**

රත්න ශ්‍රී ලියුවේය, කපුගේ, ගැයුවේය, අපි අමන්දානන්දයට පත්වුනෙමු.

ගීතයට ලොල් බැදී ප්‍රියානන්ද විජේසුන්දර විසින් රචිත දැස නිලූපුල් තේමා සරල සුමග ගීතයෙන් ප්‍රථම වරට රසික හද ගැසීම මොහොතකට නවතාලූ ගුණදාස කපුගේ දසක තුනක් පුරා සිංහල ගීත පුස්තකාලය ගොඩනගන්නට උරදුන්නේය. මෙම ජාතික කර්තව්‍යයේදී ඔහුගේ කාර්යභාරය නමැති මං පෙත ඇතැම් කළා කරුවන්ගේ මෙන් සුමට වුයේ නැත. වෘත්තිමය, ආර්ථික, සහ මානසික පීඩා කුනාටුවලට මැදිවෙමින් ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී එම ගමන ගියේය අරුමය වන්නේ මේ මහා ජීව ශක්ක්තිය තුළ ලැගුම් ගෙන සිටියේ අතිශය සංවේදී, මානව හිතවාදී, අව්‍යාජ, නිරහන්කර කුඩා මිනිසෙක් වීමය.

රත්න ශ්‍රී විජේසිංහ, සුනිල් ආරියරත්න, සුනිල් සරත් පෙරේරා, ලූෂන් බුලත්සිංහල, උදය මානවසිංහ, රන්බණ්ඩා සෙනවිරත්න වැනි විශිෂ්ට ගීත රචකයන්ගේද පණ්ඩිත අමරදේව, ප්‍රේමසිරි කේමදාස, එච් එම් ජයවර්ධන, රෝහණ වීරසින්හ වැනි අසහාය සංගීතඥයන්ගේද නිර්මාණයන්ට යාවෙමින් නිරන්තරව ජනහද ස්පර්ශකලවු ඔහුට ඇත්තේ අනුකරණය කළනොහැකි කටහඩකි. ස්භාවධර්මයා විසින් එම හඩ ඔහුගේ පුතුවන මිත්‍ර කපුගේ හට උරුම කරදී ඇත.

පසුගියදා  මෙල්බර්න් නුවර රිවර් ගම් ශාලාවේදී පියසටහන් තබමින් මිත්‍ර කපුගේ ජන හද ප්‍රකම්පනය කළා, පියාගේ මියුරු ගී ගයමින් සිය පියාණන් වෙනුවෙන් පුතෙකුට කළහැකි උපහාරය පරිපූර්ණ ලෙසින් ඉටුකළේය. රසිකයන් සමවැදී සිටි දැහැන බිද දමන්නට කාලයේ විදිලියක් වන් ගමන් වේගයට හැකිවුයේ නැත. ගායන ජිවිතයේ ඉතා කෙටි දුරක් පමණක් තරණය කාර ඇති තරුණ මිත්‍ර කපුගේ සිය ප්‍රියතම විෂය පළිබද මනා පරිස් චයකින් සන්නද්ධ වී තිබීම කාගේත් නොමද සතුටට සහ පැසසුමට යොමුවිය.

අද අප උපන් දේශය තුල මුළු ගැන්වී නිදාවටෙන සරස්වතී දේවිය හදිසියේ අවදිවී මෙල්බන් නුවර දෙසට හැරී සැනසුම් සුසුමකින් ළය සැහැල්ලූ කරගන්නට ඇතුව නිසැකය.

පියසටහන් ප්‍රසංගය මෙල්බන් නුවර සංවිදානය කර ඉදිරෙපත්කල ප්‍රසන්න කුරුකුලරත්න ඇතුළු පිරිස මනා සංයමකින් ප්‍රසංගය ඉදිරිපත්කෙරීම සදහන් කළ යුතුය, යුග ගායනයට එක්වූ පළපුරුදු ශිල්පිනියන්ට අමතරව නවක ශිල්පිනියක් වූ ජනනි කුරුකුලරතන ගේ දායකත්වය පැසසුමට ලක්විය යුතුය, වේදිකා පසුතල නිර්මාණය, ආලෝක කරණය,සංගීතය හා සංගීත අධ්‍යක්ෂණය, ශබ්ධ පරිපාලනය ඇතුළු ප්‍රසංගයකදී දැකියහැකි ප්‍රධාන සාදකයන්, ගුණාත්මක අගයකින් දකිනට ලැබීම සදහන් කලයුතුය.

Mathematics
Dias Maths
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
keerthicnc@yahoo.com
Home visiting
www.facebook.com/DiasMaths

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)
( ENGLISH SINHALESE)
Documents for immigration purposes
• BIRTH , MARRIAGE, DEATH
• EDUCATIONAL/ VOCATIONAL
• LEGAL and POLICE DOCUMENTS
• NATIONAL IDENTITY CARDS
CONTACT
DR. PREMA KUDALIGAMA
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)
Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com